**ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය - 2017**

**-------------------------------------------------------------**

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන් ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වැනි වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති
----------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ස්ථාවර වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.17,667,497 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය සමාලෝචිත වර්ෂයේදී හඳුන්වා දී ඒ අනුව සමාලෝචිත වර්ෂයට පමණක් රු.3,106,150 ක් ක්‍රමක්ෂය කර තිබුණ ද ඉකුත් වර්ෂවලට අදාල ක්‍රමක්ෂය ගණනය කර අතීතානුයෝගීව ගැලපීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්
--------------------------------

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු පාඨමාලා ගාස්තු ආදායම රු.6,094,210 ක් වුවද අදාල ලේඛනය අනුව එම ආදායම රු.5,983,586 ක් වූයෙන් රු.110,624 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාඨමාලාවන් ආරම්භකර, පාඨමාලා කාලයෙන් අඩකට වඩා වැඩි කාලයක් ගතවී තිබුණද, අදාළ කාලපරිච්ඡේදයට අය විය යුතු රු.1,294,498 ක පාඨමාලා ගාස්තු සිසුන් 121 දෙනෙකුගෙන් අයකරගෙන නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.6,094,210 ක්වූ ලැබිය යුතු පාඨමාලා ගාස්තු ආදායමෙන් රු.443,742 ක් වසරකට වැඩි කාලයක සහ රු. 451,000 ක් වසර දෙකකට වැඩි කාලයක සිට හිඟව පැවතුණි. එම ශේෂය තුල සමාලෝචිත වර්ෂයේදී පාඨමාලාව අවසන් කර සහතිකපත්‍ර නිකුත් කර තිබූ පාඨමාලා 06 කට අදාළ සිසුන් 72 දෙනෙකුගෙන් ලැබිය යුතු රු.789,500 ක් වූ පාඨමාලා ගාස්තු අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 වගන්තිය අනුව සැලසුම්ගත ක්‍රියාකාරකම්වල සත්‍ය කාර්යසාධනය සහතික කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය මගින් කලින් කලට ආයතනයේ සංයුක්ත සැලැස්ම අයවැය ලේඛනය සහ කාර්යසාධනය සමාලෝචනය කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.7,073,855 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,489,462 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,584,393 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ගාස්තු, දඩ හා අයභාර ආදායම රු.4,419,852 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල සැසඳීමේදී 2013 හා 2014 වර්ෂවලදී ඇතිවී තිබුණු ආයතනයේ ඌනතාවය 2015, 2016 හා 2017 වර්ෂවලදී මූල්‍ය අතිරික්තයක් බවට පත්වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ රු. 14,107,064 ක් වූ ආයතනයේ දායකත්වය, 2017 වර්ෂයේ රු. 32,712,686 ක් දක්වා වැඩිවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ පිරිවෙන් අධ්‍යාපනය සඳහා කෙටිකාලීන පාඨමාලා හඳුන්වාදීම, සඟරාවක් පලකිරීම, ප්‍රාදේශීය වැඩසටහන් සඳහා නව ඒකකයක් ස්ථාපිත කිරීම සහ නව බඳවා ගැනීමේ පරිපාටියක් අනුමත කර ගැනීම යන කාර්යයන් සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකර නොතිබුණි.

(ආ) 2017 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කිරීමේදී, කාර්යයන් ඉතා පුළුල්ව අර්ථ නිරූපණය කර තිබීම සහ සමස්ථ පිරිවැය ඒ ඒ කාර්යයන් සඳහා බෙදා වෙන්වෙන ආකාරය (Cost Allocation) නිරූපණය කර නොතිබීම හා ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් ආයතනයේ ඉලක්ක හා අරමුණු ළඟාවීම් නිශ්චය කිරීමට නොහැකි වී තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

ආයතනයේ ජංගම ගිණුමකට අදාලව 2017 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර ඉදිරිපත් කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව රු.282,500 ක් වූ ඍජු බැරකිරීම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 අරමුදල් උපයෝජනය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතනයේ ජංගම ගිණුම් 2 හි රු.8,293,906 ක ශේෂයක් පැවති අතර සෑම මාසයක් අවසානයේදීම රු.8,293,906 සිට රු.14,277,182 ක් දක්වා වූ පරාසයක ශේෂයක් රදවාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. මෙම මුදල් ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට හෝ කෙටිකාලීන ආයෝජනයක යොදවා ආදායමක් ලබා ගැනීමට හෝ අවධානය යොමු කර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

(අ) තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

(ආ) වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ආයතනය විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනාගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
| --- | --- | --- |
| (අ) පාඨමාලා ආදායම් ලේඛනගත කිරීම | | ආදායම් ලේඛන යාවත්කාලීනව හා සම්පූර්ණත්වයෙන් යුතුව පවත්වාගෙන නොයාම. |
| (ආ) පුහුණු වැඩමුළු හා වැඩසටහන් පැවැත්වීම | (i) | පැමිණීමේ ලේඛනයන්හි සහභාගී වුවන්ගේ අත්සන් හා පැමිණීමේ වෙලාවන් සටහන් කර නොතිබීම. |
| | (ii) | වැඩසටහන් සඳහා වෙන වෙනම ලිපිගොණු නඩත්තු කර නොතිබීම. |
| (ඇ) ප්‍රසම්පාදන කටයුතු | | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇතැම් මාර්ගෝපදේශ අනුව කටයුතු කර නොතිබීම. |